# දැන්වීමයි

## කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර (2022/2023 ප්‍රවේශ වර්ෂය) ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නේවාසික කාලය අවසන් වීම.

මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය, වැල්ලමඩම අංක 02 කාන්තා නේවාසිකාගාරය සහ පඹුරණ අංක 02 කාන්තා නේවාසිකාගාරයන්හි දැනට නේවාසිකව සිටින කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර (2022/2023 ප්‍රවේශ වර්ෂය) අධ්‍යයන කටයුතු හදාරන ශිෂ්‍ය කණ්ඩායමට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ 2023/2024 අධ්‍යයන වර්ෂයේ අවසාන සමාසික පරීක්ෂණ 2025.03.12 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත.

ඒ අනුව එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අවසාන සමාසික පරීක්ෂණ 2025.03.12 දිනෙන් අවසන් වූ පසු එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2025.03.13 දින මධ්‍යාහ්න 12.00 ට පෙර අදාළ උපශාලාධිපතිවරුන් දැනුවත්කර තමන් වෙත භාර දුන් භාණ්ඩ සහිත කාමර නිසි පරිදි භාර දී නේවාසික ලේඛනයේ අත්සන් කර නේවාසිකාගාරයෙන් ඉවත්විය යුතු බව දන්වා සිටිමි.

**තවද, නේවාසිකාගාරය තුල පවතින ඔබගේ පුද්ගලික භාණ්ඩද එම දිනයේදීම ඉවත් කරගතයුතු අතර එදිනෙන් පසු එම පුද්ගලික භාණ්ඩ සඳහා විශ්වවිද්‍යාලය මගින් වගකීමක් ගනු නොලබන බව මෙයින් දැනුම් දෙමි.**

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
2025.03.04

පිටපත - පීඨාධිපති/කළමනාකරණ හා මූල්‍ය පීඨය
ශාලාධිපතිනි
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/කළමනාකරණ හා මූල්‍ය පීඨය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/කළමනාකරණ හා මූල්‍ය පීඨය
උපශාලාධිපති/මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය
උපශාලාධිපතිනි/වැල්ලමඩම අංක 02 කාන්තා නේවාසිකාගාරය, පඹුරණ අංක 02 කාන්තා නේවාසිකාගාරය